**තෙවන වාර පරීක්ෂණය - 2024**

**ප්‍රායෝගික තාක්ෂණ කුසලතා**

පිළිතුරු පත්‍රය

08 ශ්‍රේණිය

I කොටස

1. 2
2. 2
3. 1
4. 2
5. 3
6. 3
7. 4
8. 1
9. 4
10. 4
11. විජලනය
12. බහුකාර්ය කිරීම.
13. ඇඹුල් තියල් කිරීම.
14. සිරස් වගා කුළුණු
15. මීතේන්
16. නවෝත්පාදන
17. ව්‍යාපාර අදහසක්
18. අලෙවි ප්‍රවර්ධන උපාය මාර්ග
19. යෙදවුම්
20. වෙළඳපොළ ඛණ්ඩනය

II කොටස

**කෘෂිකර්ම ක්ෂේත්‍රය**

**1)**

I.පොහොර නිපදවීම හෝ ජීව වායු නිපදවීම.(ල.01)

II.සියුම් ක්‍රමය (Intensive system) (ල.01)

වාසි

- සතුන්ගේ ආරක්ෂාව තහවුරු වේ.
- සතුන් රෝගවලින් ආරක්ෂා වීම.
- නිෂ්පාදනය වැඩිය.
- සතුන්ගේ ආහාර අවශ්‍යතා සපිරිය හැකිය.
- පාලනය හා අධීක්ෂණය කළ හැකිය.
- සමබල ආහාර ලබාදිය හැකිය වැනි එක් පිළිතුරක් සඳහා (ල.01)

අවාසි

- නිවාස සෑදීමේ වියදම අධිකය.
- ආහාර දීමේ වියදම වැඩිය.
- වැඩි ශ්‍රමයක් අවැසිය.
- සතුන්ගේ ස්වභාවික හැසිරීම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි වැනි එක් පිළිතුරක් සඳහා (ල.01)

III.නිදැලි ක්‍රමය

- අඩ නිදැලි ක්‍රමය හෝ අඩ සියුම් ක්‍රමය

  නිදැලි ක්‍රමයේ (වාසි)
  - නිවාස සැපයීම අවශ්‍ය නැත.
  - විශේෂ අවධානය අනවශ්‍යයි, ආහාර සැපයීම අනවශ්‍යයි.
  - ශ්‍රම අවශ්‍යතාව අඩුය වැනි එක් වාසියක් සඳහා (ල.01)

  නිදැලි ක්‍රමයේ (අවාසි)
  - සතුන් අනතුරු සහ රෝගවලට පහසුවෙන් ගොදුරු වීම.

- බෝග වගාවන්ට සතුන්ගෙන් හානි සිදුවිය හැකිය.
- සමහරවිට සතුන්ට සමබල ආහාර නොලැබේ.
- ආරක්ෂාව ප්‍රමාණවත් නැත.
- කිකිළියන්ගේ බිත්තර එකතු කිරීම අපහසුය වැනි එක් අවාසියක් (ල.01)

අඩ නිදැලි ක්‍රමයේ (වාසි)

- රාත්‍රී කාලයේ සතුන්ට ආරක්ෂාව ලැබේ.
- අමතර ආහාර ලබාදෙන නිසා නිෂ්පාදනය වැඩි වේ.
- සත්ත්ව අපද්‍රව්‍ය එකතු කිරීම පහසුය. වැනි වාසි 01ක් සඳහා (ල.01)

අඩ නිදැලි ක්‍රමයේ (අවාසි)

- නිවාස සැපයීමට මුදල් අවශ්‍ය වේ.
- නිවාස පිරිසිදු කිරීමට හා නඩත්තුවට ශ්‍රමය අවශ්‍ය වීම වැනි අවාසියන් සඳහා (ල.01)

2) I.වාෂ්පීකරණය ,උත්ස්වේදනය හෝ ජීවීන්ගේ ශ්වසනය වැනි ක්‍රම 02ක්

II.**නිල් දිය සම්පත්** - පොළොව මතුපිට පවතින මිරිදිය ජල ප්‍රභව - දොළ පහර,දිය ඇලි,ඔය,ගංගා,විල්ලු/පිටාර තැනි,වැව්,පොකුණු වැනි උදාහරණ 01ක්

**හරිත දිය සම්පත්** - වර්ෂාපතනය මගින් පෝෂණය වන භූ ජල සංචිතය - ළිං

III.දූනුකෙයියා ,ගල්ලැහැ,තුන්හිරියා,බොරුපන් හෝ වෙනත් ගැළපෙන ශාක වර්ග 02ක්

- නිපදවන භාණ්ඩ විදේශයන්වලට අපනයනය කිරීම, නිපදවන භාණ්ඩ විදේශිකයන්ට මිලදී ගැනීමට හැකි අලෙවිසැල් පවත්වාගෙන යාමෙන් විදෙස් සංචාරකයන්ට විකිණීම හෝ ගැළපෙන පිළිතුරු 02ක්

## <u>ආහාර ක්ෂේත්‍රය</u>

3) I.සබන් යොදා දැත් පිරිසිදු කර ගත යුතුය.
ආහාර සැකසීමේදී යොදා ගන්නා අත් ආවරණ පැළඳිය යුතුය.
පිරිසිදු ඇඳුම් ඇඳ සිටිය යුතුය.
හිස් ආවරණ පැළඳිය යුතුය වැනි පිළිතුරු 02ක්

II.සාන්ද්‍ර සීනි යොදා කල්තබා ගන්නා පලතුරු නොවන ආහාර වර්ග - ඉඟුරු, දෙහි හෝ දොඩම් ලෙලි ආදී ගැළපෙන පිළිතුරු 02ක් (ල.02)
සාන්ද්‍ර ලුණු යෙදීමෙන් කල් තබා ගන්නා ආහාර - මස්, මාළු, ගර්කින් ආදී පිළිතුරු 02ක් (ල.02)

III. a) **අධිශීතනය**

($-18^0C$) ට අඩු උෂ්ණත්වය යටතේ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම අධිශීතනයයි. මෙහිදී ආහාර මත ක්‍රියා කරන ක්ෂුද්‍ර ජීවීන් අඩපණ වී එන්සයිම අක්‍රීය වී ආහාර වැඩි කාලයක් කල් තබා ගත හැකි වේ. (ල.01)

අධිශීතනයෙන් කල් තබා ගන්නා ආහාර - මස්, මාළු, ඇතැම් පිසූ ආහාර වැනි ගැළපෙන ආහාර වර්ග 02ක්

b) **විජලනය**

ආහාරයේ අඩංගු ජලය ඉවත් කිරීමෙන් විජලනය සිදුකරයි. ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වයට ජලය අවශ්‍ය බැවින් විජලනය කරන ලද ආහාර මත ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වැළැක්වේ.ජලය නොමැති තත්වයක එන්සයිම ක්‍රියාකාරීත්වය අවම වී ආහාර නරක් වීම වැළකේ. (ල.01)

විජලනයෙන් කල් තබා ගන්නා ආහාර - කරවිල,වම්බටු,අළුකෙසෙල්,ගස්ලබු,කැරට්,අඹ,ඇඹරැල්ලා,එතු,මාළු වර්ග වැනි පිළිතුරු 02ක් (ල.01)

4) I.බෝගවල අස්වනු නෙලීමේ අවස්ථාවේ සිට ඒවා පාරිභෝගිකයා අතට පත් වන අවස්ථාව දක්වා සිදුවන හානිය පසු අස්වනු හානියයි.

II.ගුණාත්මක හානිය(ල.01)

ප්‍රමාණාත්මක හානිය(ල.01)

III.

| බෝගය | පසු අස්වනු හානිය අවම කිරීමට අස්වනු නෙලීමට | |
|---|---|---|
| | සුදුසු අවස්ථාව | සුදුසු වේලාව |
| a.තක්කාලි | ගෙඩියේ පැහැය කොළ සිට ලා රතු පැහැයට හැරුණ විට | උදය වරුවේ පින්න වියළී ගිය පසු |
| b.පලා වර්ග | මධ්‍යස්ථ පෙස මේරු අවධිය | උදය වරුවේ |
| c.කෙසෙල් | ගෙඩිවල දාර සහිත බව නැති වීම.<br>තද කොළ පැහැයේ සිට ලා කොළ පැහැ වීම. | පෙ.ව.10.00ට පෙර හෝ ප.ව.3.00ට පසු |

එක් හිස්තැනකට සුදුසු පිළිතුරු 1ක් සඳහා (ල.01)

(1 X 6 = ල.06)

## <u>ආරම්භක තක්ෂණවේදය</u>

**5)** I.

- ක්‍රියාකාරි නොවීම.
- නිසි පරිදි ක්‍රිය කරවීමේ අපහසුව.
- ක්‍රියාකාරි වීමේදී අනවශ්‍ය ශබ්ද ඇති වීම.
  සහාය පද්ධති නිසි ලෙස ක්‍රියත්මක නොවීම. ( 1 x 4 = ලකුණු 04 )

**II.**

- දෝශ සහිත ඉවත් කර, ඒ වෙනුවට අළුත් කොටස් හෝ වෙනත් උපකරණ වලින් ගලවා ගත් ක්‍රියාකාරි කොටස් යෙදවීම.
- එම යන්ත්‍ර හෝ උපකරණ නිවැරදිවගලව පිරිසිදු කිරීමෙන්:
- එම යන්ත්‍ර/ උපකරණ වල ඇති දෝශ සහිත කොටස් අළුත්වැඩියා කිරීමෙන් හෝ
  ගැලපෙන පිළිතුර සඳහා ලකුණු දෙන්න.

( 2 x 3 = ලකුණු 06 )

III.




- ස්නේහ තෙල් (ඔයිල්)
- ග්‍රීස්
- බෙයාරින් වර්ග (රෝල,බෝල,බුහු ආදි පිලිතුර දෙකක් සඳහා (1 x 2= ලකුණු 02)

**06.** I.

- නිෂ්පාදකයා සපයා ඇති අත් පොත/ උපදෙස් ප්‍රතිභාව අනුව ක්‍රියා කිරිම
- උපකරණ භාවිතයෙන් පසු පිරිසුදු කර තැබීම
- චලනය වන කොටස් නිසි කලට ස්නේහනය කිරීම
- චලනය වන කොටස් බුරුල් වූ වහාම නිවැරදිව සීරි මාරු කිරීම

ආදි ගැලපෙන පිළිතුරු 4 ක් (1x4= ලකුණු 04)

II.

| උපාංගයේ නම | ප්‍රතිඵල සටහන | කාර්යය |
|---|---|---|
| ආලොක විමෝචක ඩයෝඩය (L.E.D.) |  | දර්ශන ලෙස ආලෝකන පරපත සදහා |
| ධාරිත්‍රක (Capacitor) |  | ආරෝපණ තාවකාලිකව ගබඩා කර තැබීම. |
| විචල්‍ය ප්‍රතිරෝධක |  | විවිධ ප්‍රතිරෝදී අගයන් වලදී පරිපත ක්‍රියාත්මක කරවීම. |

( 1 x 3 = ලකුණු 03)

## <u>ව්‍යාපාර කටයුතු</u>

07. I.

- ➢ දැනුම් දීම.
- ➢ පෙලඹවීම
- ➢ සිහිපත් කරවීම (ල. 03 )

II.

- ➢ සන්නිවේදනය
- ➢ දිරිගැන්වීම
- ➢ ආරාධය (ල. 03)

III. " කිරිටොෆි'' නිෂ්පාදන විකිනීම සදහා පහත කරුණු අඩංගු ප්‍රචාරන දැන්වීමක්

- ➢ කිරිටොෆි නිෂ්පාදනයක් බව
- ➢ ඒ සදහා සුදුසුකමක්
- ➢ සුදුසු පින්තූරයක් සහා
- ➢ නිෂ්පාදනය පිළිබද කෙටි විස්තරයක් සහිත දැන්වීමක් (ල . 04)

6) I.නිෂ්පාදන පිරිවැය යනු නිෂ්පාදිත භාණ්ඩය හෝ සේවාව සදහා භාවිත කරන ලද විවිධ සම්පත් හෝ යෙදවුම්වල අගයයි. නැතහොත් ඒ සදහා දැරූ මිල ගණන් එකතු කොට ගණනය කරන ලද වටිනාකමයි. (ල.01)

II.ද්‍රව්‍ය පිරිවැය
ශ්‍රම පිරිවැය
පොදු කාර්ය පිරිවැය (ල.03)

III. a.මුළු නිෂ්පාදන පිරිවැය = වක්‍ර පිරිවැය + සෘජු පිරිවැය

= රු.15000 + රු.(21500+3500)

= රු.40000.00 (ල.01)

b. ඒකක නිෂ්පාදන පිරිවැය = මුළු නිෂ්පාදන පිරිවැය / කේක් සංඛ්‍යාව

= රු.40000 / 20

= රු.2000.00 (ල.02)

c.ලාභ ප්‍රතිශතය = රු.2000 X 20/100

= රු.400.00 (ල.01)

කේක් ඒකක විකුණුම් මිල = නිෂ්පාදන පිරිවැය + ලාභ ප්‍රතිශතය

= රු.2000 + රු.400

= රු.2400.00 (ල.02)